# තරුණයා හා තාක්ෂණය



අද ජීවත්වන ළමුන්ගේ සමහර දෙමාපියනට, තම බාල කාලයේ ඔවුනගේ නිවාසවලට විදුලි බලයවත් තිබුණේ නැත. එහෙත් අද බාල පරපුර ජීවත් වන නිවාස,තාක්ෂණයේ නිවාස බවට පරිවර්තනයව ඇත. නිරන්තරයෙන් පණිවුඩ හුවමාරු කර ගනිමින්, වීඩියෝ ක්‍රීඩා කරමින් ගත කරන ඔවුන් ගේ ජීවන රටාව විසින් ඔවුනගේ ජීවිත වෙනස් කරන අයුරු පිළිබඳ විමර්ශනාත්මකයක්.





## යවමුද පොඩි පණිවුඩයක්

තාක්ෂණය ආධාරයෙන් ළමුන් ගසන අලුත්ම පිණුම් ගැන දැනගන්න ඕනෑ ද? ඔන්න එකෝමත් එක ලෝකෙක ඒ ළමයි ඊ-මේල් (e-mail) යවනවලු, ඒකක්ෂණ පණිවුඩ යවනවලු, හිතාගන්නවත් බැරි තරම් මහා සංකීර්ණ සෙලියුලර් දුරකථන පාවිච්චි කරනවලු. අනේ ඉතින් ඒ ගොල්ලන්ගෙ දෙමව්පියෝ මේව නොදුටු දෑසින්, නොඇසූ කනින් ඉන්නවලු.

## සුව පහසුම සන්නිවේදන මාධ්‍යයේ පටි ගැලවේ! ආරක්ෂාව තටු ගසා පිටවේ !!

30% ක් බාලිකාවන් හෙළි කර ඇති ආකාරයට සල්ලාප කාමරයන්හිදී ඔවුන් ලිංගික අතවරයන්ට ගොදුරුව ඇත.

93% ක් බාලිකාවන් තම දෙමාපියන් විසින් ඔවුන්ට ඉන්ටර්නෙට් බැලීමට යාමට දීමෙන් වලක්වාවි යන බියෙන් තමන්ට වූ ලිංගික අතවරයන් දෙමාපියන්ට හෙළිකර නැත

86% පවසා ඇත්තේ තම දෙමාපියන්ට තමන් මොනවා කරන්නේදැයි නොදැනෙන පරිදි ඔවුන්ට ඉන්ටර්නෙට් මගින් සල්ලාපයන්හි යෙදිය හැකි බවයි.

57% දෙනාට තම දෙමාපියන්ගේ ඊ-මේල් (e-mail) කියවිය හැකිලු

54% දෙනාට තම දෙමාපියන්ට නොදැනෙන පරිදි සයිබර් සම්බන්ධතා පවත්වාගෙන යා හැකිලු

## ළමයින්ගේ අණ්ඩර දෙමළ තේරුම් ගනිමු

ළමයින්ට එන ඊ-මේල් (e-mail) කියවන්න ඔබට පූර්ණ අයිතියක් තිබෙනවා. ළමයින් භාවිත කරන Emoticon සංඥා සංකේත තෝරා ගන්න මෙන්න යතුර.

| සලකුණ | අරුත | සලකුණ | අරුත |
|---|---|---|---|
| :) | සිනාසෙමි | gtg | යන්නම් |
| :( | රවමි | lae | කුමක් වුනත් |
| :0 | අන්තිම අමාරුයි | jmo | මගේ අදහස නම් |
| :D | විරිත්තමි | lol | හයියෙන් හිනාවෙමි |
| ;) | ඇසක් ගසමි | lylas | ඔබට සහෝදරියක සේ ආදරය කරමි |
| :P | කාටවත් කියන්න එපා | nrn | යළි පිළිතුරක් බලාපොරොත්තු නොවෙමි |
| btw | ඒක නෙවේ | otoh | අනිත් අතට |
| brb | දකුණු පසට වන්න | rotfl | බිම පෙරළි පෙරළි සිනාසෙමි |
| f2f | මුහුණට මුහුණ | tia | දැන්ම තියා ස්තූතියි |
| fwiw | එය කොච්චර වටිනවද | tyvm | ඔබට බෙහෙවින් ස්තූතියි |

Saman Malalasekera

## වීඩියෝ ක්‍රීඩා

විද්‍යුත් ක්‍රීඩා හා සෙල්ලම් කරන්න පටන්ගත්ත බාල පරපුර ගැන විවිධ පැතිකඩවලින් කළ පර්යේෂණ තොරතුරු ගොන්නක් මෙහි වේ. ලොව පුරා බාල පරම්පරාවේ හදවත ආකර්ෂණය කර ගැනුමට රූපවාහිනියට හෝ සිනමාවට වඩා වීඩියෝ ක්‍රීඩා සමත් වී ඇති බැවින් ඔවුන්ගේ ඒ නැඹුරුව කොයිබටදැයි හඳුනා ගැනීමට ඔබට මෙය ප්‍රයෝජනවත් වනු ඇත.




| ළමුන් ඉන්ටර්නෙට් සබඳතා ඔස්සේ ක්‍රීඩා කිරීම වර්ධනය වන අයුරු | 1999 | 2001 | 2002 |
|---|---|---|---|
| | 18% | 31% | 37% |

මේ රටවල අවුරුදු 9-16 අතර ළමයි දිනකට වීඩියෝ ක්‍රීඩා කරන විනාඩි ගණන මෙන්න

| | | | |
|---|---|---|---|
| ග්‍රීසියලය | විනාඩි 65 | ස්වීඩනය | 43 |
| ඩෙන්මාර්කය | 57 | ස්පාඤ්ඤය | 36 |
| පින්ලන්තය | 46 | ජර්මනිය | 34 |
| ඉතාලිය | 45 | ස්විට්සර්ලන්තය | 34 |
| බ්‍රිතාන්‍යය | 44 | නෙදර්ලන්තය | 28 |

## ඉන්ටර්නෙට් සහ පාසල



### ලෝකයේ දියුණු රටක ළමුන් ඉන්ටර්නෙට් එකෙන් පාසල් වැඩ කරන අයුරු විමසමු ද?

| කැනඩාව | 1999 | 2003 |
|---|---|---|
| පාසලේ සිට ගෙදර ගෙනආ වැඩ ඉන්ටර්නෙට් ආධාරයෙන් විසඳූ ප්‍රතිශතය | 30% | 40% |

| | පිරිමි ළමයි | ගැහැනු ළමයි |
|---|---|---|
| ඉන්ටර්නෙට් ආධාරයෙන් පාසල් වැඩ ගවේෂණය කරමින් සතියකට ගත කළ පැය ගණන | 2.0 | 2.9 |

## හොංකොං

### යෞවන යෞවනියන් තම විවේක සුවයේ විශ්‍රාන්තිය විඳින අයුරු දැනගනිමුද?

| | පිරිමි ළමයි | ගැහැනු ළමයි |
|---|---|---|
| ඉන්ටර්නෙට් සමග එක්වන්නන් | 34% | 31% |
| රූපවාහිනිය නරඹමින් | 31% | 26 |
| සඟරා සහ පත්තර කියවමින් | 26 | 25 |
| ඉන්ටර්නෙට් මගින් පිළිසඳරේ යෙදෙමින් | 24 | 45 |
| ගුවන් විදුලියට සවන් දෙමින් | 9 | 11 |

## එක්සත් රාජධානිය

70% ක් අවුරුදු 10 සහ ඊට වැඩි ළමුන්ට සිය නිවාසයන් තුළම වෙබ් සබඳතා පවතී

52% ක් ළමෝ සතියකට පැය පහකට වඩා ඉන්ටර්නෙට් සමඟ ගත කරති

80% ක් දෙමාපියෝ තම දරුවන්ගේ පෞද්ගලික පරිගණක යන්ත්‍රයන්ගේ අනිසි වැඩසටහන් ලබා ගැනීමට හැකි මාර්ග අවහිර කිරීමට නොදනිති

67% ක් ළමයින් තමන්ගේ දෙමාපියන්ට වඩා පරිගණක යන්ත්‍ර පිළිබඳ දැනුම් තේරුම් ඇත්තෝ ය.

